**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

බලයලත් සැලසුම් ශිල්පීන් ලෙස සර්වේයර් ජනරාල්වරයාගේ සහතිකය නිකුත් කිරීමේ විභාගය - 2026

බලයලත් සැලසුම් ශිල්පියෙකු ලෙස වෘත්තියේ යෙදීමට සර්වේයර් ජනරාල්වරයාගේ සහතික පත්‍රය නිකුත් කිරීම සඳහා වන විභාගය අයදුම්කරුවන්ගේ ප්‍රමාණය සහ පදිංචිය අනුව දිවයිනේ ස්ථාන කිහිපයක දී හෝ කොළඹ දී පවත්වනු ලැබේ. මෙම විභාගය කොටස් දෙකකින් සමන්විත වේ.

I කොටස - බණ්ඩාංක පත්‍ර පිළියෙල කිරීම
II කොටස - පිඹුරු ඇඳීම

2. විභාගයේ I කොටස 2026 ජූලි මස 25 දින දී ද, II කොටස 2026 ඔක්තෝබර් මස 24 දින දී පැවැත්වෙනු ඇත. I කොටසින් අසමත් වන අපේක්ෂකයින්ට II කොටසට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. විභාගයේ කොටස් දෙකෙන්ම එකවර සමත්වන අපේක්ෂකයින්, බලයලත් සැලසුම් ශිල්පීන් සඳහාවන සර්වේයර් ජනරාල්වරයාගේ සහතිකය ලැබීමට සුදුසුකම් ලබනු ඇත.

3. විභාගයේ දී, අපේක්ෂකයින්ට පහත සඳහන් දෑ කළ හැකි බවට මා හට ඒත්තු ගැන්විය යුතු ය.

(අ) ක්ෂේත්‍ර සටහනක් මගින් බණ්ඩාංක පත්‍රයක් නිවැරදිව පිළියෙල කිරීමට හා පරික්‍රමණයක් බණ්ඩාංක කිරීමට ;

(ආ) CAD මෘදුකාංගය භාවිතයෙන් හා බණ්ඩාංක ආධාරයෙන් නිවැරදිව පිඹුරක් නියැකීමට, ක්ෂේත්‍රඵලය ගණනය කිරීමට හා Microsoft Excel සහ Microsoft Word ආධාරයෙන් දෙන ලද ආකෘතියට අනුව ඉ.වි. ලැ. ලිවීමට සහ දෙන ලද පිඹුරක් අංකිතකරණය කිරීම හා මුල් පරිමාණයට පිළියෙල කර මුද්‍රණය කිරීමට සහ බ්‍රිතාන්‍ය ඒකක ක්‍රමය යටතේ ඇති පිඹුරක් ඉල්ලනු ලබන මෙට්‍රික් පරිමාණයකට අනුව විශාලනය කර හෝ කුඩා කර අනුරේඛනය කරගැනීමට ;

4. විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් :

(අ) ජාතික අධ්‍යාපන සහතික පත්‍ර විභාගයෙන් හෝ අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සම්මාන සාමාර්ථ දෙක (02) ක් සහිතව විෂයයන් හය (06) කින් සමත්වීම,

*සහ*

(ආ) රජයේ කාර්මික විද්‍යාලයක හෝ වෙනත් අර්ධ රාජ්‍ය ආයතනයක, අවුරුද්දකට නොඅඩු කාල සීමාවක් සහිත, සැලසුම් ශිල්පය හා සම්බන්ධ පාඨමාලාවක් සාර්ථකව නිම කර තිබීම.

5. විභාග ගාස්තු :

5.1 විභාගයේ I වැනි කොටස සඳහා ගාස්තුව රු. 1,200.00 කි. මෙම මුදල සර්වේයර් ජනරාල් කාර්යාලයේ සරප් කවුන්ටරය වෙත, ඕනෑම දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයක් හෝ දියතලාව මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය වෙත හෝ https://govpay.lk මගින් මාර්ගගත ක්‍රමයට මුදල් ගෙවා ලබාගත් රිසිට්පත අයදුම්පත්‍රයේ ඒ සඳහා වෙන් කර ඇති ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතු ය. (රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබාගත යුතු ය.) විභාග ගාස්තුව මුදල් ඇණවුම් හෝ මුද්දර මගින් හෝ චෙක්පත් මගින් භාරගනු නොලැබේ. රිසිට්පත නොමැතිව ඉදිරිපත් කරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5.2 විභාගයේ II වැනි කොටස සඳහා විභාග ගාස්තුව රු. 6,800.00 කි. විභාගයේ I වැනි කොටස සමත් (විෂයයන් දෙක සඳහා ලබාගත් මුළු ලකුණු එකතුවේ සාමාන්‍යය 60% ක් විය යුතු ය.) අයදුම්කරුවන් වෙත ඒ බව ලිඛිතව දැනුම් දෙනු ලැබේ. විභාගයේ I වැනි කොටස සමත් අය පමණක් II වැනි කොටස සඳහා විභාග ගාස්තු ගෙවා නැවත ඉල්ලුම් කළ යුතු ය.

6. *අයදුම්පත් සකස් කිරීම හා ඉදිරිපත් කිරීම* :

මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සෙ.මී. 21x සෙ. මී. 29 (ඒ 4) ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් සකස් කරන ලද අයදුම්පත්‍රයක්, පහත දැක්වෙන ලිපිනයට ලැබෙන සේ තැපැලෙන් යැවිය යුතු ය. ලියුම් කවරයෙහි ඉහළ වම් කෙළවරේ "බලයලත් සැළසුම් ශිල්පීන් ලෙස සර්වේයර් ජනරාල්ගේ සහතිකය නිකුත් කිරීමේ විභාගය - 2026" යනුවෙන් සඳහන් කරන්න.

ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි (විභාග),
විභාග අංශය,
සර්වේයර් ජනරාල් කාර්යාලය,
තැ. පෙ. 506,
කොළඹ 05.

දෙනලද ආදර්ශ අයදුම්පතට අනුකූලව පිළියෙල කර නොමැති අයදුම්පත් ද, නිසි පරිදි සම්පූර්ණ කර නොමැති අයදුම්පත් ද, *ගැසට්* නිවේදනයේ සඳහන් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. මෙම විභාගය සඳහා ගෙවන ලද ගාස්තු කුමන හේතුවක් නිසා හෝ ආපසු ගෙවනු නොලැබේ.

8. අයදුම්පත් **2026 මැයි** මස **29** දින හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතු ය. එදිනට පසුව එවනු ලබන අයදුම්පත් භාරගනු නොලැබේ.

9. (I) විභාගයේ පළමුවන කොටස සඳහා අවශ්‍ය බණ්ඩාංක පත්‍ර හා කඩදාසි විභාග ශාලාවේ දී සපයනු ලැබේ. බණ්ඩාංක ගණනය කිරීමට අවශ්‍ය ගණිත වගු හා අවශ්‍ය අනෙකුත් උපකරණ රැගෙන ආ යුතු ය. විභාග ශාලාධිපතිගේ අවසරය ඇතිව මෘදුකාංග රහිත සාමාන්‍ය විද්‍යාත්මක ගණක යන්ත්‍ර භාවිතා කිරීමට ඉඩ දෙනු ලැබේ.

(II) විභාගයේ දෙවන කොටස සඳහා අවශ්‍ය මුද්‍රණ කඩදාසි සහ මුද්‍රණ යන්ත්‍ර විභාග ශාලාවේ දී සපයනු ලැබේ. CAD මෘදුකාංගය, Microsoft Excel, Microsoft Word සහිත ලැප්ටොප් පරිගණකයක්, මෘදුකාංග රහිත ගණක යන්ත්‍රයක් සහ අවශ්‍ය අනෙකුත් උපකරණ රැගෙන ආයුතු ය.

10. (i) සෑම විභාග අපේක්ෂකයෙකු ම විභාග ශාලාධිපති සෑහීමට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන ලියවිලි අතරින් එකක් ඉදිරිපත් කළ හැකි ය.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද හැඳුනුම්පත;

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය;

(ඇ) විභාගය පවත්වන දිනට අවුරුදු තුනකට වැඩි නොවන කාලයක් ඇතුළත ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක අධිකාරිත්වය යටතේ නිකුත් කරන ලද අයදුම්කරුගේ ඡායාරූපයක් ද සහිත බලපත්‍රයක් හෝ අනන්‍යතා ලියවිල්ලක්

(ii) ඉහත 10(i) හි පරිදි තමන්ගේ අනන්‍යතාවය සම්බන්ධයෙන් සාක්ෂි ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

4. මෙම විභාගය මෙට්‍රික් ඒකක ක්‍රමය යටතේ පැවැත්වෙනු ඇත.

**පී. කේ. එල්. එස්. පඬුවාවල,**
සර්වේයර් ජනරාල්.

2026 අප්‍රේල් මස 23 දින,
සර්වේයර් ජනරාල් කාර්යාලය,
තැ. පෙ. 506,
කොළඹ 05.